# භික්ෂූන් වහන්සේලාගේ ගමන් පහසුව සලසා නිවන් දකින තුරු සුගතියේ සැප විඳින්න

## ගොසීසනික්ඛේපක ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 434 - 435)

භික්ෂූන් වහන්සේලා වඩින මඩ සහිත මගෙහි ගමන් පහසුව සඳහා ගව හිස් කබලක් ඇතිරූ අයෙකුට ලැබුණේ මහත් ආනිසංසයකි.

කල්ප අනූ හතරක් සුගතියේ සැප විඳි ඔහු අජානීය අශ්වයින්, සෛන්ධව අශ්වයින් ආදී ශීඝ්‍ර වාහන ද සක්විති රජ සම්පත් ද ලබා අවසානයේ දී ගෞතම බුදු සසුනේ පැවිදි ව සසර ගමන කෙළවර කළේය.